ශරීර ලංකාවේ සිත් එංගලන්තයේ

උසස් මානසික බලයකින් යුක්ත පුද්ගලයන් ලංකාවේ පහළ නොවීමට හේතුව කුමක්ද?

(නවීන තක්ෂිලාවට යන සිංහල මානවකයෝ)

එංගලන්තයේ සිටින සිංහල මානවකයෙකුගේ උත්තරීතර අදහස්

සිංහලයන්ගේ නින්දා ලැබිය යුතු මානසික වහල්භාවය දුරුකළ යුත්තේ කෙසේද?

"නවීන තක්ෂිලාවට යන සිංහල මානවකයෝ" යන ශීර්ෂයෙන් පසුගිය අගෝස්තු මස 11 වෙනි දින ස්වදේශ මිත්‍රයා පළකළ වාක්‍යය පත්‍රය කියවන බොහෝදෙනාට මතක ඇත. එංගලන්තයේ ඉගෙනීම ලබා ලංකාවට පැමිණෙන ශිෂ්‍යයන් පිළිබඳ තියුණු විමංසනයක් එයින් කර තිබුණේය. මේ ලිපිය කියවූ දැනට එංගලන්තයේ සිටින ඇල්.එච්. මෙත්තානන්ද මහතා විසින් අප වෙත එවා තිබෙන අතිශයින් ප්‍රෞඩ අදහස් රාශියකින් ගහණ වූ වටිනා ලිපියක් පහත පළවේ. ආනන්ද, නාලන්දා ආදී බෞද්ධ විද්‍යාලයන්හි උප ප්‍රධානාචාර්‍ය ආදී පදවි දරමින් සිට එංගලන්තයට ගොස් ස්වකීය ඉගෙනීම යථා ස්ථාන ගතකර ගැනීමේ යෙදී සිටින මේ තරුණ මහතාගේ වැදගත් අදහස් හැම සිංහලයෙකුගේම විමංසන බුද්ධියට ගෝචර විය යුතුය. ඇතැම් කෙනෙකුගේ සිත් සංවේගයෙනුත් ඇතැම් කෙනෙකුගේ සිත් විළියෙනුත් ඇතැම් කෙනෙකුගේ සිත් විනෝදයෙනුත් පුරවන අදහස්වලින් යුක්ත මේ ලිපිය අපි ඉතා ආශාවෙන් පළකළෙමු."

යුධ නැතිවෙන්ට නම්

පසුගිය අගෝස්තු මස 11 වෙනි දින නිකුත් කරන ලද "ස්වදේශ මිත්‍රයා" පත්‍රයෙහි 'නවීන තක්ෂිලාවට යන සිංහල මානවකයෝ' යන මාතෘකාවෙන් පළවූ වාක්‍යය ප්‍රීතියෙන් කියවා බැලුවෙමි.

ලංකාවෙන් අවුරුදු පතා ඉගෙනගැනීම පිණිස චංගලන්තයට පැමිණෙන ශිෂ්‍යයන්ට කරන විශාල වියදමෙන් ඵලක් තිබේද නැද්ද යන බව ලංකාවට හිතැති සියලුදෙනා විසින් දැනගතයුතු කාරණයකි.

චංගලන්තයේදී ඉගෙනීම ලබා රටට වැඩදායක කර්මාන්තයක් ආරම්භ කළ සිංහලයෙකු නැති බවද, ලෝකප්‍රකට ශාස්ත්‍රඥයෙක් වූ සිංහලයෙකු නැති බවද, අමුතු දෙයක් නිපදවූ සිංහලයෙකු නැති බවද ඇත්තකි. ඒ මක් නිසාද?

ලංකාව ගැන යම් ප්‍රසිද්ධියක් දැන් ලෝකයේ ඇත්තේ නම්, ඒ ඇත්තේ කාරණා දෙකක් නිසාය. පළමුවෙනි කාරණය නම් ලංකාවේ අලංකාරභාවය වේ. පිටරට ගමනේදී මට මුණගැසුණු ඉංග්‍රීසිකාරයා හෝ ප්‍රංසකාරයා හෝ ජර්මන්කාරයා හෝ වෙනත් ජාතියකට අයත් කෙනෙකු හෝ මා ලංකාවේ කෙනෙක්ය කියා දැනගත්විට "අහෝ නුඹලාගේ ලංකාව කොපමණ ලක්ෂණ රටක්ද, එහි වාසය කිරීමට වාසනාවෙන්ට ඕනෑය" යි කියති. ලංකාවේ ප්‍රසිද්ධියට හේතු වූ දෙවෙනි කාරණය නම් බුද්ධ ධර්මය අවිච්ඡින්නව පැවතීමය.

ස්වීඩිෂ් ජාතික අධිශාස්ත්‍රඥ හර් මන්නියැන්ඩර් නම් පණ්ඩිතයා ජර්මනියේ මයින් ගඟබඩ පිහිටි ප්‍රැන්ක්පෝට් නම් නුවරදී මා සමඟ කථාකරද්දී 'ජරා රූපං හරති' කියමින් 'මෙවැනි ගැඹුරු අදහස් මෙනෙහි කළ තැනැත්තා එසේ මෙසේ කෙනෙක් නොවේය. මුළු ලොවටම අයිති ශ්‍රේෂ්ඨ උත්තමයෙක් ය' යි කීවේය. තවද යුරෝපීය මහා යුද්ධයෙන් පසු බටහිර ශිෂ්ටාචාරයේ තිබෙන අන්තරායද හිස්කමද අවබෝධ වූ බොහෝ බටහිර පඬිවරු ලෝකයේ යුද්ධ නැතිවෙන්ට නම් අන්‍යෝන්‍ය මෛත්‍රිය අත්තිවාරම් කොට බුදුරජාණන්වහන්සේගේ ධර්මය ලොව පැතිරෙන්ට ඕනෑ බව ප්‍රකාශ කරති. එක් දවසක් බර්ට්‍රැන්ඩ්‍රසල් නම් ලෝක ප්‍රසිද්ධ ඉංග්‍රීසි පඬිවරයා ලන්ඩන් නුවර යුනිවර්සිටි කොලේජ් නම් ශාස්ත්‍ර ශාලාවේදී ක්‍රිස්තියානි ධර්මය නිසා යුරෝපයට ඇතිවුණු බලවත් විපත පෙන්වා දෙමින් 'මහත්වරුනි, තමුන්නාන්සේලා මා අදහන ආගම කුමක්දැයි මගෙන් ප්‍රශ්න කළොත් බුද්ධාගම යයි කියමි' යි විශාල පිරිසක් ඉදිරිපිටදී කීයේය.

අපට දෙවියෝ ඔවුන්ට ලිපිකරුයි

ලෝකයට ශාන්තිය ගෙනදීමට බලය ඇති මේ බුද්ධ ධර්මය නොකඩව පැවතගෙන ආ ලංකාවේ දැන් ඇතිවන ශිෂ්‍යයන්ට අමුතු දේ නිපදවන ඥානය පහළ නොවන්නේ මක් නිසාද? ලංකාවෙන් ඉගෙනීම ලබාගැනීමට චංගලන්තයට පැමිණෙන්නේ ඉතා දක්ෂ වූ ශිෂ්‍යයන් බැවින්

ඔවුන්ට ලෝකප්‍රකට ශාස්ත්‍රඥයන් වෙන්ට බැරි මක් නිසාද? ඒ කෙසේ වෙතත් එංගලන්තයට යන ලාංකික ශිෂ්‍යයන්ගෙන් වැඩිදෙනා තම තමන්ගේ ඉගෙන ගැනීමේ කටයුතු ඉතාම ප්‍රශංසනීය අන්දමට ඉෂ්ට කරන බැවින් ඔවුන් ගැන සිංහල ජනයා ආඩම්බර විය යුතුයි. මේ ශිෂ්‍යයෝ තම තමන්ට එංගලන්තයේදී ඉගෙනගන්ට ඕනෑ දේ ලංකාවේ පාඨශාලාවේදී ඉගෙන ගත් දේ අනුවද රටේ තොටේ වඩා හොඳය කියා පිළිගන්නා දේ අනුවද නියම කරගනිති. බොහෝ ලාංකික ශිෂ්‍යයෝ සිවිල් නිලධාරී විභාගයෙන් සමත්වීමට උත්සාහ දරති.

අපේ මිනිසුන් සිවිල් නිලධාරීන් දෙවියන් සේ සලකන්ට පුරුදුව සිටින බැවිනි. නමුත් එංගලන්තයේ මිනිස්සු සිවිල් නිලධාරීන් ලිපිකරුවන් හැටියට සලකති. එමනිසා එංගලන්තයේ සිවිල් නිලධාරියාට විශේෂ ගෞරවයක් නැත. අපේ රටේ මිනිසුන් සිවිල් නිලධාරියාට කරන ගරු බුහුමන් හේතුකොට ගෙන සිවිල් නිලධාරීකමට පත්වුණු සමහරෙක් නිවන් ලැබුවා යයි කල්පනා කරති. එක් ලාංකික සිවිල් නිලධාරියෙකුට කරන්ට තිබුණේ බලු ලැයිසන් අත්සන් කිරීමයි. ඉතින් ඔය රාජකාරි කරලා ලෝකප්‍රකට වෙන්ට පුළුවන්ද? එමනිසා ඉගෙනීමෙහි දක්ෂ වූ ලාංකිකයන් සිවිල් නිලධාරී විභාගය හිස් මුදුනේ තබාගැනීම බේදයට කරුණකි.

රිලවි නටවන සමාගම

ලාංකික ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් ඉංග්‍රීසි වෛද්‍යකම්ද ඉගෙන ගනිති. ලාංකික ඉංග්‍රීසි වෛද්‍යයෝ අමුතු දේ සොයා රටට යහපතක් කරත් නම් එය ආඩම්බරවීමට කරුණකි. ඒ වෙනුවට ඉංග්‍රීසි වෛද්‍ය විභාගවලින් සමර්ථ වී තෘප්තියට පැමිණීම අයහපතකි. ලාංකික ඉංග්‍රීසි වෛද්‍යයා මතක් වන විට රිලවෙක්ද රිලවු නටවන්නෙක්ද මතක් වේ. රිලවු නටවන්නා රිලවාට ආමන්ත්‍රණය කොට "පුංචක්කේ, නැන්දම්මාලාගේ ගෙදර තඩ ගෙනියන්නාසේ පලයන්" කියයි. එවිට රිලවා එකී ලෙස කරයි. රිලවු නටවන්නා නම් බ්‍රිතාන්‍ය වෛද්‍ය සමාගමය. මේ සමාගම නොපිළිගත් කිසිම බෙහෙතක් ඉංග්‍රීසි වෛද්‍යයෙකුට කරන්ට බැරිය. එමනිසා ඒ සමාගම අනුමත කළ බෙහෙත් පමණක් ලාංකික ඉංග්‍රීසි වෛද්‍යයෝද 'එහෙයි හාමුදුරුවනේ' කියා පිළිගනිති.

අමුතු බෙහෙත් සොයා ගැනීමට ආශාවක් අපේ ඉංග්‍රීසි වෛද්‍යයන්ට ඇත්නම් සිය රටේ අවුරුදු දහස් ගණන් පුරුදු කරගෙන එන සිංහල බෙහෙත්වල ගුණාගුණ ඉංග්‍රීසි ශාස්ත්‍ර ක්‍රමයට සොයා දැනගන්ට බැරි මන්ද? ප්‍රසිද්ධ ඉංග්‍රීසි වෙද්දු අසාධ්‍ය කියා අත්හැරපු ලෙඩ සිංහල වෙදාගේ කසායෙන් සුවකර තිබේ නම් ඒ සුවවීමට හේතුව

සිංහල ඖෂධයෙන් බව නොඅනුමානයි. ඒ සිංහල ඖෂධවල ගුණ ඉංග්‍රීසි ක්‍රමයෙන් සොයා දැනගනු වෙනුවට ලාංකික ඉංග්‍රීසි වෛද්‍යයෝ "කසාය ගොඩේ මිනිහාට හොඳය" යි සිංහල වෙදකමට නිග්‍රහ කරති.

සිංහල පිළිකුල් කරන සිංහලයා

සිංහල දේවලට සිංහලයාම පිළිකුල් කිරීම ලංකාවේ පිරිහීමට ප්‍රධාන හේතුවය. සිංහල ළමයා පියාට 'පප්පා' හෝ 'ඩැඩී' කියාද මෑණියන්ට 'මම්මා' හෝ 'මමී' කියාද කියයි. 'තාත්තා', 'අම්මා' යන නම් ගොඩේ මිනිසුන්ට හොඳය කියා ඉංග්‍රීසි වෙස්ගත් සිංහලයෝ කියති. සිංහල රටේ සිංහලයන් විසින් සිංහල භාෂාවෙන් කථා කිරීම අවමන්කොට සලකනු ලැබේ.

සිංහල ප්‍රවෘත්ති පත්‍රද සිංහල ග්‍රන්ථද පහත්කොට සලකනු ලැබේ. සිංහල ගුරුවරයාටද, සිංහල ගොවියාටද, සිංහල වෛද්‍යයාටද, සිංහල භික්ෂූන් වහන්සේටද නින්දා කරති. සිංහල භාෂාව, සිංහල චාරිත්‍ර වාරිත්‍ර, සිංහල ඉතිහාසය, සිංහල ශිල්ප ශාස්ත්‍ර, සිංහල ග්‍රන්ථ යන මේවා මනා සේ දන්නේ සිංහල ගුරුවරයා හෝ සිංහල ගොවියා හෝ සිංහල වෛද්‍යයා හෝ සිංහල භික්ෂූන් වහන්සේ හෝ නොවේද? ඉංග්‍රීසි වෙස්ගත් සිංහලයන් මොවුන්ට නින්දා කරන නමුත්, සමහර සිංහල ගුරුවරුද, සිංහල වෛද්‍යයෝද, සිංහල භික්ෂූන් වහන්සේලාද කොපමණ ඥානවත්ද කීවොත්, ඔවුන් ඉංග්‍රීසි ඉගෙනගෙන සිටියා නම් ලන්ඩන් සමස්ත ශාස්ත්‍ර ශාලාවේ බී.ඒ, ඇම්.ඒ. යනාදී විභාගවලින් සමර්ථවීම පහසු වැඩක් බව නිසැකයි.

නමුත් අපේ රටේ නම්බුව ඉංග්‍රීසි දැනීමේ හැටියටයි. ඉංග්‍රීසිකාරයා කථා කරන හැටියට ඉංග්‍රීසි වචන ශබ්ද නගා කථාකරන්ට පුළුවන් නම් 'චියා තමයි හරි හපනා' ඉංග්‍රීසි භාෂාව ශුද්ධව කථාකිරීම ඉංග්‍රීසිකාරයාට ඉපදීමෙන් භාර වූ වැඩකි. චිංගලන්තයේ නූපන් අයගෙන් චිය බලාපොරොත්තු නොවිය හැක. උගත්කමේ ලකුණ ඉංග්‍රීසි හොඳාකාර කථාකරන්ට පුළුවන්වීම නම් ලන්ඩන් නුවර වීථියක් වීථියක් ගානේ කම්මුල් තොල් සායම් කරගෙන පිරිමින් කොතැනදී අල්ලා ගනිමුදෝයි හිත හිතා නන්නත්තාරේ ඇවිදින සිය දහස් ගණන් ඉංග්‍රීසි ළමිස්සියන් ඉහත කී ඉංග්‍රීසි නොදත් සිංහල ගුරුවරුන්ටද, වෙදුන්ටද, භික්ෂූන්වහන්සේලාටද පමණක් නොව කථා කිරීම ඉංග්‍රීසියෙන් පටන් නොගත් සියලුම ඉංග්‍රීසි උගත් සිංහලයන්ටත් වඩා උගතුන් බව පිළිගන්ට ඕනෑ. උගත්කම මනින මිම්ම ඉංග්‍රීසි දැනගත් තරම නොව කල්පනාව හා ක්‍රියාපටිපාටිය බව ඉංග්‍රීසි භාෂාව නැමති දේව රූපයට නමස්කාර කරන සිංහලයන් හැර අන් සියලුම මනුෂ්‍යයෝ පිළිගනිති.

ශරීරය මෙහේ හිත එහේ

මේ ඉංග්‍රීසි භාෂාවට තිබෙන වාල්කම නිසා අපේ ළමයින්ට කුඩා කාලයේ පටන් උගන්වන්නේ එංගලන්තයේ තිබෙන්නා වූ දේවල් ගැනය. ඉංග්‍රීසි පාඨශාලාවල අපේ ළමයි භාවිත කරන්නේ ඉංග්‍රීසි ළමයින්ට ඉගෙන ගැනීමට එංගලන්තයේ ප්‍රසිද්ධ කරන පොත් පත්ය. ඒ පොත්පත්වල කියා තිබෙන්නේ ලංකාවේ ගස් කොළන් ගැන නොව එංගලන්තයේ ගස් කොළන් ගැනය. ලංකාවේ සතුන්ගේ විස්තර නොව එංගලන්තයේ සතුන්ගේ විස්තරය, ලංකාවේ සිරිත් විරිත් නොව එංගලන්තයේ සිරිත් විරිත් ගැනය. ලංකාවේ මිනිසුන් ගැන නොව එංගලන්තයේ මිනිසුන් ගැනය. එමනිසා

මේ පොත්පත් භාවිත කරන සිංහල ළමයින්ගේ ශරීර ලංකාවේ නමුත් හිත් එංගලන්තයේය.

තවද නත්තල් කෑම වෙනුවෙන් තරකරන්ට පාත්තයාගේ කටේ කෑම පුරවන්නා සේ ඉංග්‍රීසි විභාග වලින් සමර්ථ කරවා ගැනීමට සිංහල ළමයින්ගේ මොළවල ඔවුන්ට නොතේරෙන ඉංග්‍රීසි ඉතිහාසයේ අනම් මනම් පුරවති. ඉංග්‍රීසි ඉතිහාසයේ පිරී තිබෙන මිනීමැරුම්, හොරකම්, වධ බන්ධන යනාදියෙහි විස්තර සියලු ළමයින්ට උගන්වති. නමුත් සිය රටේ පුරාණ රජ දරුවන් විසින් මහජනයාගේ දියුණුව පිණිස ඇතිකොට අද දක්වා පෙනෙන්ට තිබෙන දේවල් ඕනෑකමින් නූගන්වති. ලංකා ඉතිහාසය කේම්බ්‍රිජ් ලන්ඩන් විභාගවලට උවමනා නැත. ඉංග්‍රීසි පාඨශාලාවල උගන්වන්නේ කේම්බ්‍රිජ් ලන්ඩන් සමස්ත ශාස්ත්‍රශාලා නියම කරන දේ පමණකි. අපේ රටේ දියුණුව පිණිස නැත්නම් අපේ ළමයින්ගේ ඥාණය වැඩි දියුණු කිරීම පිණිස අපේ ළමයින්ට උගන්වන්ට සුදුසු කාරණා ඒ සමස්ත ශාස්ත්‍රශාලා නොදනිති. ඇරත් ඒ සමස්ත ශාස්ත්‍රශාලා පිහිටුවා තිබෙන්නේ එංගලන්තයේ ළමයින්ගේ ප්‍රයෝජනයටම බව ඒ සමස්ත ශාස්ත්‍රශාලාවල ගුරුවරයෝ පවා ප්‍රසිද්ධියේ කියති. අපේ වහල්ගතිය නිසා අපේ ආගම පවා අපේ ළමයින්ට ඉගැන්වීමට සමහර බෞද්ධ ඉංග්‍රීසි පාඨශාලාවල භාවිතා කරන්නේ බුද්ධ ධර්මයට විරුද්ධ වූ තියොසොපිස්ට් ආදී මත අඩංගු බුද්ධාගම ගැන ඉංග්‍රීසියෙන් ලියාපු පොත්ය.

තවද අපේ චාරිත්‍ර වාරිත්‍රද, අපේ භාෂාවද, අපේ ඉගැන්වීම්ද එංගලන්තයේ පිළිවෙළටම යොදාගෙන යනු ලැබේ. මේ වහල්කමින් ලංකාවට දියුණුවක් ඇතිවෙන්ට විශාල භූමි කම්පාවක් හටගෙන ලංකාද්වීපය පිහිටි තැනින් ගිලා බැස නැවත උතුරු මුහුදින් මතු වී එංගලන්තයට පූට්ටු වෙන්ට ඕනෑය.

ගමරට එපාවූ සිංහලයෙක්

ඉගැන්වීමෙහි අති දක්ෂ වූ ශාස්ත්‍රඥයෝ ළමයකුගේ හදු ඉගෙනගැනීමට ඔහු කුඩා කාලයේ පටන් ඉගෙන ගන්නා වූ සියලුම කාරණා ඔහු ජීවත්ව සිටින ප්‍රදේශයද ඔහුගේ අසල්වාසීන්ද සමඟ සම්බන්ධ වෙන්ට ඕනෑ බව ප්‍රකාශ කරති. භාෂාව, ගණිතය, ඉතිහාසය, භූමි ශාස්ත්‍රය, රසායන ශාස්ත්‍රය, ද්‍රව්‍ය ධර්ම ශාස්ත්‍රය යනාදී සියලුම ශිල්පද, ශාස්ත්‍රද ළමයා උපන් රට හා සම්බන්ධ විය යුතුයි. මේ සම්බන්ධය නැතිව චිංගලන්තයේ පාවිච්චි කරන පොත්පත් වලින් චිංගලන්තයේ ශාස්ත්‍රශාලා වලට උවමනා අන්දමට අපේ ළමයි ඉගෙන ගනිත් නම් ඔවුන්ගේ ශරීර ලංකාවේ තිබෙද්දී හිත් චිංගලන්තයේ පදිංචි වෙති. මෙය දරුණු වූ විපතකි. මේ දුකින් පීඩිත වූ තැනැත්තාගේ මුළු කාලය ගත කරන්නේ ඒ අමාරුවෙන් බේරෙන්නටයි. ඔය අමාරුව තිබෙද්දී අමුතුවෙන් කරුණු සොයා දැනගන්නා නුවණ පහළ නොවේ. මේ අමාරුව දරාගන්ට බැරිවී චක්තරා අවුරුදු 16 ක් වයසැති මා අඳුනන සිංහල ළමයෙක් අග්‍ර ඉංග්‍රීසි පාඨශාලාවක ඉගෙන ගනිමින් සිටියදී මතු දක්වන අදහසට ලියුමක් ඉංග්‍රීසි භාෂාවෙන් ලියා මෑණියන්ට යැව්වේය.

"මාගේ ආදරවන්ත මෑණියනි, නුඹ බුදුන්ට මල් පූජා කරන්ට කියා පෝය දවස්වල පන්සලට යන බව මම දනිමි. දැන් කාලේ නම්බුකාර ඉහළ පවුල්වල මිනිස්සු එසේ නොකරති. එමනිසා නුඹ පහත් මිනිසුන්ගේ සිරිත් අත්හිටවනවා ඇතැයි මම නිතර බලාපොරොත්තු වෙමි. තවද මේ කාලයේදී වැදගත් සිංහල මිනිස්සු ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරති. එමනිසා නුඹ මා සමඟ ඉංග්‍රීසියෙන් කථාකරන්ට ඉංග්‍රීසි භාෂාව ඉගෙනගන්ට ඕනෑය. එසේ කළොත් මම ගෙදර නැවතීමට එමි" යනුයි.

මේ සිංහල ළමයා ලංකාවේ වාසය කිරීමට අසතුටු බවත් චිංගලන්තයේ වාසය කිරීමට ඉතාම සතුටු බවත් මට කීපවතාවක් කීවේය. අපේ ළමයින්ට මෙවැනි අදහස් ඇතිවෙන්ට හේතුව නම් අපේ ඉගැන්වීම් පිළිවෙළේ තිබෙන දෝෂයයි. සිංහල භූමිය, සිංහල ඉතිහාසය, සිංහල ශිල්ප ශාස්ත්‍ර, සිංහල භාෂාව, සිංහල ශිෂ්ටාචාරය පෙරටු කොට නැති කිසිම ඉගැන්වීම් පිළිවෙළක් සිංහල ළමයාට නොසෑහේ. යම්තාක් කාලයක් වහල්ගතිය දියුණු කරන්නා වූ දැන් පවතින අන්තරාදායක ඉගැන්වීම් පිළිවෙළ පවතීද ඒතාක් කාලයක් අමුතු දේ සොයා දැනගන්නා නුවණ සිංහල ළමයාට පහළ නොවේ. ශාස්ත්‍රඥයෙකු හැටියට කිසිම සිංහලයෙක් ලෝකප්‍රකට නොවේ.

මේ වහල්කම බොහෝ දුරට අද ලංකාවේ පැතිර තිබෙන බව නොඅනුමානයි. සිංහල ගුරුවරයාද, සිංහල වෛද්‍යයාද, සිංහල ගොවියාද, සිංහල භික්ෂූන්වහන්සේද පහත් අය හැටියට ඉංග්‍රීසි වෙස්ගත් සිංහලයන් සලකන බව වරක් කීවෙමි.

තවද ඉංග්‍රීසි භාෂාවටද, ඉංග්‍රීසි චාරිත්‍රයටද, ඉංග්‍රීසි නමටද වහල්වී සිටින සිංහල පෙරකදෝරු තැන, සිංහල බැරිස්ටර් තැන, සිංහල දොස්තර තැන, සිංහල ඉංජිනේරු තැන කොපමණ මේවාට වහල්වී සිටිත්ද කීවොත් තමන්ගේ ඒ වහල්කම සඟවාගන්නා අටියෙන් දෝ අනුන් ලවා පෙරකදෝරු හාමුදුරුවෝ, බැරිස්ටර් හාමුදුරුවෝ, දොස්තර හාමුදුරුවෝ, ඉංජිනේරු හාමුදුරුවෝ කියා ආමන්ත්‍රණය කරවා ගනිති. මොවුන් තරමට නූගත් දිසා හාමුදුරු ආදීන් ගැන කියනුම කවරේද? එංගලන්තයේ වහලුන් නැති නිසා බ්‍රිතාන්‍ය අග්‍ර රාජ්‍යයේ ඉතා බලසම්පන්න ධානාන්තරය උසුලන මහා අමාත්‍යයාද අනිත් මන්ත්‍රීහුද සාමාන්‍ය මිනිසුන් හා එකිනෙකාට ගැටෙමින් බස්වලද, විදුලි රියවලද, රේල්ලුවලද ගමන් කරති.

ඇති කළ යුතු සමානත්වය

ලංකාවේ වහල්කම නැතිවීමට දැන් පවතින ඉගැන්වීම් පිළිවෙළ වෙනස් කළ යුතුයි. සියලුම සිංහල ළමයි සිංහල භාෂාවෙන්ද, සිංහල ඉතිහාසයෙන්ද, සිංහල ශිෂ්ටාචාරයෙන්ද සමන්විත වූ අත්තිවාරමක් පිට අභිනව ක්‍රමවලට අනුව ශිල්ප ශාස්ත්‍ර හැදෑරිය යුතුයි. සියලුම සිංහල ළමයි ලංකාවේ ගස් කොළන් ගැනද, ලංකාවේ සතුන් ගැනද, ලංකාවේ භූමිය ගැනද විශේෂයෙන් දැනගත යුතුයි. සිංහල ග්‍රන්ථ මගින් පුරාණ සිංහලයාගේ කල්පනාද ක්‍රියාද වර්තමාන සිංහලයාගේ කල්පනාද ක්‍රියාද හරියාකාර දැනගත යුතුයි. අභිනව ශාස්ත්‍රක්‍රම සිංහල භාෂාව මගින් ඉගෙනගත යුතුයි. ඉංග්‍රීසි භාෂාව දෙවෙනි භාෂාව මෙන් සැලකිය යුතුයි. මේ සවි වූ අත්තිවාරම පිට සිංහලයාගේ ඉගෙනීම නැමති ගෙය තැනුවොත් කාටත් වැඩ සිදුවේ. එසේ නැතුව දැන් පවතින අත්තිවාරම වැනි දුර්වල අත්තිවාරමක් පිට තැනුවොත් නොබෝ කලකින් ඒ අත්තිවාරම බැසීමෙන් කඩා වැටෙන බිත්තිවලට අසුවී ගෙයි පදිංචි කාරයාද මරුමුවට පත්වේ. නියම අත්තිවාරම පිට සිංහලයා ගේ ඉගෙනීම නැමති ගේ බැඳීමට

සිංහල ගුරුවරයා ඉංග්‍රීසි ගුරුවරයාට සමානවද, සිංහල වෛද්‍යයා ඉංග්‍රීසි වෛද්‍යයාට සමානවද, සිංහල ගොවියා ඉංග්‍රීසි වැවිලිකාරයාට සමානවද, සිංහල වඩුවා ඉංග්‍රීසි ඉංජිනේරුවාට සමානවද, සිංහල සිත්තරා ඉංග්‍රීසි සිත්තරාට සමානවද, සිංහල ගායනාකාරයා ඉංග්‍රීසි ගායනාකාරයාට සමානවද, ආණ්ඩුව සහ මහජනයා විසින් සැලකිය යුතුයි.

ඒ සමානත්වය ඇති කිරීමට ඉංග්‍රීසි ගුරුවරයාද, ඉංග්‍රීසි වෛද්‍යයාද, ඉංග්‍රීසි වැවිලිකාරයාද, ඉංග්‍රීසි ඉංජිනේරුවාද, ඉංග්‍රීසි සිත්තරාද, ඉංග්‍රීසි ගායනාකාරයාද යන මේ අය දන්නා වූ ඉංග්‍රීසි පිළිවෙළවල් සිංහල භාෂාවෙන් සිංහල ගුරුවරයාටද, සිංහල වෛද්‍යයාටද, සිංහල ගොවියාටද, සිංහල වඩුවාටද, සිංහල සිත්තරාටද, සිංහල ගායනාකාරයාටද ඉගැන්වීමට සුදුසු

ශාස්ත්‍රශාලා පිහිටුවිය යුතුයි. දැනට ඇමරිකා, එංගලන්ත, ජර්මන්, ප්‍රංස, ඩැන්මාර්ක් යනාදී ප්‍රදේශවල රක්ෂාවල යෙදී හෝ නොයෙදී ඉන්නා වූ බාල වයස්කාරයා පටන් අවුරුදු 55 ක් හෝ වැඩි ගණනක් වයසැති වැඩිමහල්ලා දක්වා ඉගෙනීමෙන් ප්‍රයෝජන ගන්ට පුළුවන් සියලුමදෙනාට ඉගෙනගන්ට ඕනෑකරන සියලුම කාරණා සිය බසින් ඉගැන්වීමට නානා විධ ශාස්ත්‍රශාලා පිහිටුවා තිබෙත්.

එංගලන්තයේ අධ්‍යාපන මණ්ඩලයේ 1926-27 වර්ෂයේ වාර්තාවේ හැටියට වැඩිමහලුන්ට පමණක් ඔවුන් කැමති කැමති දේ ඉගැන්වීමට එංගලන්තයේ පමණක් හාරදහස් නවසිය එකළොසක් (4911) ශාස්ත්‍රශාලා පිහිටුවා තිබෙත්. ඉගැන්වීම සඳහා වියදම් දැරීමට එකී රටවල ආණ්ඩු නිතරම සූදානම්ව සිටිති.

කළ යුතු ඝෝෂාවක්

ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ඉංග්‍රීසීන්ගේ වෙළඳාම්ද ඉංග්‍රීසීන්ගේ වැවිලි කර්මාන්තද ලංකාවේ වර්ධනය කිරීමයි. එමනිසා සිංහල මනුෂ්‍යයන්ගේ දියුණුව ඇති කරදෙන ඉගැන්වීම් පිළිවෙළක් ලංකා ආණ්ඩුව විසින් මහජනයාගේ ඉල්ලීම නැතිව පිහිටෙව්වොත් බස්නාහිර පැත්තෙන් ඉරපායාවි. එමනිසා ලංකාවේ දියුණුවට හිතැති සියලුදෙනා දවසින් දවස ගමක් ගමක් පාසා, නුවරක් නුවරක් පාසා, පලාතක් පලාතක් පාසා මුළු ලංකාව එක නින්නාද වෙන සේ හරි ඉගැන්වීම් පිළිවෙළක් පිහිටුවා ගැනීමට ආණ්ඩුවෙන් තරයේ ඉල්ලා සිටිය යුතුයි. හරි ඉගැන්වීම් පිළිවෙළක් පිහිටුවා ගත්විට දැනට පවතින සිංහලයාගේ වහල්ගතිය හීන වේ. තවද ඉගෙනීමෙහි හරි අත්තිවාරම දමාගත් ශිෂ්‍යයාට අමුතු දේ සොයා දැනගන්නා වූ නුවණ පහළවෙනවාට නිසැකයි. උසස් ඉගෙනීමෙහි අභිලාෂී වූද ඉගෙනීමෙහි හරි අත්තිවාරම දමාගත්තා වූද ශිෂ්‍යයා සියරටදීම ඉගෙන සියරට ඉගෙන ගන්ට බැරි දේ පිටරට සමස්ත ශාස්ත්‍රශාලාවන්හිදී ඉගෙන ආපසු සිය රටට පැමිණේ. ඒ පැමිණිවිට තමා ඉගෙන ගත් දේ මුලපටන් ක්‍රම ක්‍රමයෙන් සියරට හා සමඟ ඒකාබද්ධ කරමින් ආ නිසා මේ සිංහලයාගේ හිත ඉහත දක්වන ලද හේදයෙන් තොර වේ. එනම් ඔහුගේ ශරීරය ලංකාවේ තිබෙද්දී හිත එංගලන්තයේ වාසය නොකරයි. එමනිසා ඉගෙනීමෙහි හරි අත්තිවාරම දමාගෙන ලෝකයෙහි දවස්පතා දියුණුවෙන්නා වූ ශාස්ත්‍ර ක්‍රමවල ආධාරයෙන් ස්වකීය ඥානය දියුණු කරමින් දවසරින මෙවැනි සිංහලයෙකුට රටට වැඩදායක කර්මාන්තයක් ආරම්භ කරන්ට පුළුවන. ලෝකප්‍රකට ශාස්ත්‍රඥයෙකු වෙන්ට පුළුවන. අමුතු දෙයක් නිපදවන්ට පුළුවන.

1929 සැප්තැම්බර් 10 වෙනි දින ලන්ඩන් නුවරදීය.